## පළමුවන කියැවීම

ජෙරමියා 23:1-6

ජෙරමියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**"විසිරී ගිය මාගේ බැටළු රැළ නැවත රැස් කර
ඔවුන් පෝෂණය කරන පිණිස එඬේරුන් පත් කරන්නෙමි."**

මාගේ තණබිමේ පෝෂණය වන බැටළුවන් වනසා විසුරුවා හරින එඬේරුන් පිට සමිඳාණන් වහන්සේගෙන් පැමිණෙන විපතක මහත! මාගේ සෙනග පෝෂණය කළ යුතු මේ එඬේරුන් ගැන ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ වදාරන දේට සවන් දෙන්න. නුඹලා මාගේ බැටළුවන් රැක බලා නොගෙන, ඔවුන් විසුරුවා පන්නා දැමුවහු ය. දැන් මම නුඹලාගේ නපුරු ක්‍රියා නිසා නුඹලාට දඬුවම් කරන්නෙමි. මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය. එහෙත් මාගේ රැළෙන් ඉතිරි වන්නන් මා විසින් ඔවුන් පන්නා දැමූ සියලු දේශවලින් මම ම රැස් කර නැවත ඔවුන්ගේ ගාලට ගෙනෙන්නෙමි. ඔව්හු බෝ වී වැඩි වන්නෝ ය. ඔවුන් පෝෂණය කරන පිණිස මම එඬේරුන් පත් කරන්නෙමි. ඔව්හු තවත් භය නොවන්නෝ ය. නොකැළඹෙන්නෝ ය. ඔවුන්ගෙන් එකෙක් වත් නැති නොවන්නේ ය. මෙසේ පවසන්නේ ස්වාමින් වන මම ය. ස්වාමින් වන මම මෙසේ වදාරමි; දාවිත්ගේ පෙළපතින් දැහැමි රජ කෙනෙකු නැගී එන කාලය පැමිණෙන්නේ ය. එතුමාණන් නැණ නුවණින් රජකම් කරමින්, දැහැමිකමත් යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත. එතුමන්ගේ රජ දවස, ජුදා ගළවනු ලබන්නෝ ය. ඉශ්රායෙල්වරු සුරැකි ව වසන්නෝ ය. "අපේ දැහැමිතාව" යන්නෙන් එතුමාණෝ නම් කරනු ලබන්නා හ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 123:1-4

පිළිතුර: සමිඳාණෝ මා එඬේරාණෝ ය. මට කිසි අග හිඟයක් නොවන්නේ ය.

ගීය: සමිඳාණෝ මා එඬේරාණෝ ය. අග හිඟ මට නොවන්නේ ය. එතුමාණෝ සුනිල් තණ බිම් මත මා සතප්පවා නිසල දිය වෙත මා පමුණුවා මා පණගන්වන සේක. සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දැමිටු මඟ මා ගෙන යන සේක.

මරණය වැනි ගන්දුරු රුදුරු නිම්නය මැදින් ගියත්, ඔබ මා සමග බැවින්, මට කිසි බියක් නොවන්නේ ය. ඔබේ කෙවිට ද සැරයටිය ද මා නියත සැනසිල්ල වන්නේ ය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී මංගල බොජුනක් පිළියෙල කර දී මා සිරස තෙලින් ආලේප කළ සේක. මාගේ කුසලාන උතුරා යන්නේ ය. ඔබේ දයාව හා කරුනාව නියතව, දිවිහිමියෙන් මා අනුව එන්නේ ය. සමිඳුන්ගේ නිවාසය මාගේ සදතන වාසය වන්නේ ය.

## <u>දෙවන කියැවීම</u>

එපේසි 2:13-18

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**"දෙපක්ෂයම සමගි කළ අපගේ සාමයාණෝ ක්‍රිස්තුස් වහන්සේ ය."**

එහෙත් ක්‍රිස්තුස් වහන්සේ තුළින් වරක් දුර සිටියා වූ ඔබ, දැන් උන් වහන්සේගේ දිවි පිදීම කරණකොටගෙන ළං කරනු ලැබුවහු ය. ජුදෙව්වරුන් හා විජාතිකයන් එක් කරමින් උන් වහන්සේ අප අතර සමගිය ඇති කළ සේක. උන් වහන්සේ මිනිසත් බව ගෙන, ඔවුන් වෙන් කළ, ඔවුන් අතරේ වෛරය ඇති කළ, මැද බිත්තිය කඩා දැමූ සේක. මේ දෙජාතිය, නව මනුෂ්‍යාත්වයක් කොට මවා, සමගිය ඇති කරන පිණිස, උන් වහන්සේ නීති රීති ඇතුළත් ව්‍යවස්ථාව අවලංගු කළ සේක. කුරුසිය කරණකොටගෙන උන් වහන්සේ වෛරය නැති කර දෙවියන් වහන්සේ උදෙසා ඒ දෙජාතිය එකම ශරීරයක් වන පිණිස සමගි කර වදාළ සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>සාධුකාරය</u>

ජුවාම් 10:27

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනන්නෙමි.
ඔව්හු ද මා පසු පස්සේ එති"යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

මාක් 6:30-34

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**" ඔව්හු එඬේරෙකු නැති බැටළු රැළක් මෙන් සිටිය හ."**

ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙත රැස්ව තමන් කළ සියල්ල ද ඉගැන්වූ සියල්ල ද උන් වහන්සේට සැළ කළහ. එවිට උන් වහන්සේ කතා කරමින්, "ඔබ පමණක් වෙන් ව, හුදකලා තැනකට අවුත් මඳ වේලාවක් විවේක ගන්නැ"යි ඔවුන්ට වදාළ සේක. එසේ කීවේ, ඔවුන්ට කෑම කන්න වත් අවකාශයක් නැති තරමට යන එන අය බොහෝ වූ බැවිනි. එවිට ඔව්හු පමණක් ඔරුවෙන් හුදෙකලා තැනකට ගියෝ ය. බොහෝ දෙනෙක් ඔවුන් යනවා දැක, ඔව්හු කවරහු දැ යි හැඳින, සියලු නුවරවලින් එක් වී ගොඩින් දිව අවුත්, ඔවුන්ට පෙර එහි පැමිණියහ. උන් වහන්සේ ගොඩට ආ කල, මහ පිරිසක් දැක, එඬේරෙකු නැති බැටළුවන් වැනි වූ, ඔවුන්ට අනුකම්පා කොට, ඔවුන්ට බොහෝ දේ උගන්වන්න පටන්ගත් සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.